2007 අංක 04 දරණ දකුණු පළාත් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුල ජීවත් වන ආබාධ සහිත තැනැත්තන් උදෙසා වූ සභාවක් පිහිටුවීම හා සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමටත් ඔවුනට ආත්මාභිමානයකින් යුක්තව ජීවත් වීමට හැකි වන පරිදි සංවර්ධන අවස්ථා. සුභ සාධන පහසුකම් සැලසීමත් සහ ඊට සම්බන්ධ හෝ ආනුෂාංගික කාරණා සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ . පළාත් සභාව විසින් මෙසේ පවත්වනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

මෙම ප්‍රඥප්තිය "2007 අංක 04 දරණ දකුණු පළාත් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේය.

1. පරමාර්ථ :

(1) ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුනට ආත්මාභිමානයකින් යුක්තව ජීවත් වීමට හැකි වන පරිදි අවශ්‍ය සංවර්ධන අවස්ථා, සුභ සාධන පහසුකම් සැලසීම පිණිස ආබාධිතතාව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය දකුණු පළාත තුළ ක්‍රියාත්මක කරවීම සඳහා වූ සභාවක පිහිටුවීම.

(2) ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුනට ආත්මාභිමානයකින් යුක්තව ජීවත් වීමට හැකි වන පරිදි අවශ්‍ය අවස්ථා ලබාදීම හා සහන සැලසීම සඳහා දකුණු පළාත තුල ක්‍රියාත්මක පළාත් / රජ්‍ය ආයතන. රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික අංශය ඒකාබද්ධ කර මෙහෙයවීම.

(3) දකුණු පළාතේ ලියාපදිංචි ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන ඔවුන්ගේ දෙමාපිය සංවිධාන. රාජ්‍ය නොවන සංවිධාන සහ ඔවුන්ට සේවා සපයන ආයතන ඇතුළු අනෙකුත් ආයතන සම්බන්ධීකරණය කිරීම සහ මෙහෙයවීම.

1 කොටස

පළාත් උපදේශක සභාවක් පිහිටුවීම.	2	(1)	ආබාධ සහිත තැනැත්තන් උදෙසා " දකුණු පළාත් උපදේ... හඳුන්වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය හැක්කේය.
		(2)	එකී සභාව ඉහත (2) (1) වන වගන්තියෙහි ඊට දී ඇති... පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තබාගත හැකි සංස්ථාවක් වන... ඒ සභාව විසින් ද ඊට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි...
සභාවේ සංයුතිය	3	(1)	" සභාව " පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වි...
		(2)	ආබාධිත තැනැත්තන් නියෝජනය කිරීම පිණිස ආබාධ සහිත... වන පළාත් සංවිධාන සහ ආබාධ සහිත තැනැත්තන් සඳහා... සංවිධාන, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන දෙමාපිය ... කරමින් අමාත්‍ය මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසි... සාමාජිකයින් 6 දෙනෙකු.
		(3)	දකුණු පළාත්සභා මන්ත්‍රීවරු තිදෙනෙක්, පළාත් පාලන ... /නගරාධිපති, වෘත්තික හෝ පූජක තුමන්ලා/ස්වාමින් වහ... නිලධාරීන් යන අය නියෝජනය වන අයුරින් අමාත... අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 04 දෙනෙ...
		(4)	ආබාධිත තැනැත්තන් සඳහා වූ දකුණු පළාත් මධ්‍යස්ථානයේ...
		(5)	සභාවේ සභාපති වරයා විෂය භාර අමාත්‍යවරයා වන්නේය.
		(6)	දකුණු පළාත් විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා) ස... වන්නේය.
උපදේශක සභාවේ ධුර කාලය	4		උපදේශක සභාවට පත් කල සාමාජිකයින් නම් කල දින සිට ව... ධුරය දැරිය යුත්තේය.
පරිශ්‍රමික ගෙවීම්	5		ආණ්ඩුකාරවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ... සාමාජිකයින්ට ගෙවිය හැකි වන්නේය.
ධුරයෙන් ඉල්ලා අස්වීම	6	(1)	අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය විමසා හේතු දැක්වීමකින් ... සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කලහැකි වන්නේය. තවද ඔහුට/... පූර්වගාමියාගේ ඉතිරි ධුර කාලය දැරිය හැකි වන්නේය. පත් කරන ලද සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත්... හේතුවෙන් යම් තැනැත්තකු ඒ වෙනුවට පත්කල හැකි අතර, ... ගාමියාගේ ඉතිරි ධුර කාලය දැරිය හැකි වන්නේය.
		(2)	පත් කරන ලද සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත්... යම් තැනැත්තකු ඒ වෙනුවට පත් කළ හැකි අතර, ඔහු ...යාද... ඉතිරි ධුර කාලය දැරිය හැකි වන්නේය.

(3) අමාත්‍යවරයා ආමන්ත්‍රණය කරන ලද ලිඛිත ඉල්ලීමකින් ඕනෑම සාමාජිකයෙකුට ඉල්ලා අස්විය හැකි වන්නේය.

රැස්වීම් පැවැත්වීම හා ගණපූර්ණය

7 (1) සභාපතිවරයා රැස්වීමේ මුලසුන දැරිය යුතු අතර. සභාපතිවරයා පැමිණ නැති අවස්ථාවක වෙනත් සාමාජිකයෙකු සභාපති ලෙස තෝරා ගත හැකි වන්නේය.

(2) සභාවේ රැස්වීමක ගණපූර්ණය සාමාජිකයන් 5 දෙනෙකු විය යුතු වන්නේය.

(3) විශේෂ කැඳවීමක් නොකරන ලද හැම අවස්ථාවකම අවම වශයෙන් මාසයකට වරක් සභාව රැස්විය යුතු වන්නේය.

8 සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු දකුණු පළාත් සමාජ සේවා අධ්‍යක්ෂවරයා විසින් කළ යුතුය.

සභාවේ මුද්‍රාව

9 (1) උපදේශක සභාවේ නිළ මුද්‍රාව එකී සභාව විසින් නිශ්චය කරන ආකාරයකින් විය හැකි අතර. සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය.

(2) එකී නිල මුද්‍රාව උපදේශක සභාවේ සභාපති විසින් නම් කරනු ලබන තැනැත්තකු භාරයේ තබා ගත හැකි වන්නේය.

උපදේශක සභාවේ කාර්යයන්

10 (1) දකුණු පළාත තුළ ක්‍රියාත්මක ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා ඔවුනට ආත්මාභිමානයකින් යුක්තව ජීවත්වීම සඳහා අවකාශ සලසන සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන හා සංවිධාන ආබාධිතතාව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලවත් ආබාධිත තැනැත්තන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් පනවා ඇති හා වරින්වර පනවනු ලබන පනත් සහ එකී පනත් යටතේ මධ්‍යම රජයේ අමාත්‍යවරයා විසින් විටින් විට පනවනු ලබන නියෝගවලට අනුකූලවත් මෙම ප්‍රඥප්තියට සහ පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන පනත්වලට අනුකූලවත් කටයුතු කරන බවට වගබලා ගැනීම.

(2) ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ගත යුතු පියවර පිළිබඳව දකුණු පළාත් සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

(3) ආබාධ සහිත තැනැත්තන් සඳහා වඩා හොඳ ජීවන තත්ත්වයක් ළඟා කර දීම.

(4) ආබාධ සහිත තැනැත්තන්ගේ අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස හා ගුණාත්මකව සපුරාලන බවට වගබලා ගැනීම.

(5) ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණයක පෙනී සිටීම සඳහා නියෝජිතයෙක් පත් කිරීමට බලය ඇත්තේය.

පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන කමටු පිහිටුවීම

11 (1) දකුණු පළාත තුළ ආබාධ සහිත තැනැත්තන්ට අවස්ථා හා සේවාවන් සපයන පහත සඳහන් පළාත් /රාජ්‍ය දෙපාර්තමේන්තු ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන සහ රාජ්‍ය නොවන ආයතන හා පෞද්ගලික අංශයේ නියෝජිතයින් ගෙන් සැදුම්ලත් පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන කමටුවක් ආබාධිත තැනැත්තන් සඳහා වූ පළාත් මධ්‍යස්ථානයක් උපදේශක සභාවේ එකඟතාවය අනුව පිහිටුවනු ලැබිය හැකි වන්නේය.

(2) ආබාධිත තැනැත්තන් සඳහා ජාතික හා පළාත් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පළාත් කමටුව හා මධ්‍යස්ථානය මෙහෙයවීම, මග පෙන්වීම හා උපදෙස් දීම පළාත් උපදේශක සභාව විසින් කළ යුතුය.

උපදේශක සභාවේ බලතල හා කාර්යයන්

12 (1) උපදේශක සභාව විසින් ඉටු කල යුතු කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

උපදේශක සභාවේ සාමාජිකයෙකුට හෝ උපදේශක සභාව බලය පැවරූ නිලධාරියෙකුට යම් රාජ්‍ය / රාජ්‍ය නොවන සංවිධානයක කටයුතු පරීක්ෂා කිරීමට බලය ඇත්තේය.

(2) උපදේශක සභාව විසින් රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වන විට අදාල ඇමතිවරයා වෙත හා රාජ්‍ය නොවන සංවිධානයක් වන විට රාජ්‍ය නොවන සංවිධානය ලියාපදිංචි කරන ලද බලධරයා වෙත නිර්දේශකයක් ඉදිරිපත් කළ හැකි වන්නේය.

(3) කිසියම් රාජ්‍ය නොවන සංවිධානයක් දිගින් දිගටම ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් හා සැප විහරණයන් නොසලකා කටයුතු කරන්නේ නම් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂක මණ්ඩලයක නිර්දේශ මත එම සංවිධානයට/ ආයතනයට එරෙහිව නඩු පැවරීමට බලය ඇත්තේය.

(4) මෙබඳු සංවිධානයක් සම්බන්ධයෙන් අධිකරණයෙන් තීන්දුව ලැබෙන තාක් කල් නේවාසික ආබාධිත තැනැත්තන්ගේ හා සේවකයින්ගේ සැප විහරණයන් මනාව පවත්වා ගෙන යාමට නියෝජිතයෙක් පත් කල හැක්කේය. එකී නියෝජිතයාට ලිඛිතව බලය පවරනු ලැබිය යුතු වන්නේය.

(5) එබඳු ආයතනයක් නඩත්තු කිරීම සඳහා මාසිකව දැරිය යුතු වියදම ගණනය කර එම මුදල අදාල ස්වේච්ඡා සංවිධානයෙන් අය කර ගැනීමටත්, සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීමටත් උපදේශක සභාවේ නියෝජිතයෙකුට බලය ඇත්තේය.

(6) නඩුව පවත්වාගෙන යන කාලය තුල එකී සංවිධාන සතු බැංකු ගිණුම් පාලනය හා ආදායම් රැස් කිරීම් නියෝජතයාගේ එකගත්වය මත පමණක් කළ යුතුය. ඒ සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට නියෝජිතයාට බලය ඇත්තේය.

(7) දකුණු පළාත තුළ ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල හා සැළසුම් වල සත්‍යතාවය අධ්‍යයනය කිරීමට සභාවට බලය ඇත්තේය.

(8) ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන පළාත් කමටුවට ඉදිරිපත් වන ප්‍රතිපත්තිමය ගැටළු විමර්ශණය කිරීම හා ඒ සඳහා නිර්දේශයන් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට ඉදිරිපත් කිරීම ඊට කළහැකි වන්නේය.

(9) දකුණු පළාත තුල ඉදිකර ඇති හා ඉදි කරන පොදු ගොඩනැගිලි පිළිබඳ අධ්‍යයනය කර ප්‍රවේශ පහසුකම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළ හැක්කේය.

14 උපදේශක සභාව අල්ලස් හෝ දූෂණ විමර්ශන පණතේ අර්ථානුකූල උපලේඛණගත ආයතනයක් ලෙස සැලකිය යුතුය.

15 උපදේශක සභාවේ සාමාජිකයෙකු මේ ප්‍රඥප්තිය විධානය මත කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වූ විටක එකී සාමාජිකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

11 වන කොටස - මුදල්

ගිණුමක් පවත්වාගෙන යෑම

16 (1) උපදේශක සභාවේ පරිපාලන වියදම් දකුණු පළාත් සභා අරමුදල් මගින් දරනු ලබන්නේය.

(2) උපදේශක සභාවේ සියළුම වියදම් දකුණු පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සුභ සාධන ව්‍යාපෘතිය යටතේ දැරිය යුතු අතර. ඒ සඳහා වූ ගිණුම් පවත්වා ගෙන යා හැකි වන්නේය.

111 වන කොටස - ලියාපදිංචි කිරීම

සභාව වෙත ලියාපදිංචි වීම

17 (1) යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධායක් මේ ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කර ඇත්නම් මිස. කිසිදු ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ආබාධ සහිත තැනැත්තන්ට කෙලින්ම හෝ යම් ආයතනයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් මගින් හෝ සංවිධානයක් මගින් හෝ කවර හෝ ආකාරයකින් හෝ අන්දමකින් සේවා හෝ සහන සැපයීමෙහි නොයෙදිය යුතුය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේදී යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් එවැනි සේවා හෝ සහනය සැපයීමේ නිරතව සිටියේ නම් 1 වන උප වගන්තියේ විධිවිධාන නොතකා නියමිත දිනයේ සිට මාස 03 ක් තුළදී . ඒ සංවිධානය ලියාපදිංචි කළ යුතුය.

(3) යම් ස්වේච්ඡා සංවිධානයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ වෙනත් කිසියම් ඕනෑම ආකාරයක සංවිධානයක්. සමාගමක් හෝ ආයතනයක් ඉහත් ආකාරයට ලියාපදිංචි වී නැත්නම් දකුණු පළාත් ආබාධ සහිත පුද්ගලයක් සඳහා සේවා හෝ සහන සැපයීමක් සිදු කිරීමට පෙර ඒ සඳහා දකුණු පළාත් සමාජ සේවා අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය. එකී අනුමැතිය ලබාදීමේදී අදාල කාර්යය සැළසුම පිළිබඳ අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දෙනු ලබන උපදෙස්. නිර්දේශ හා මග පෙන්නුම්වලට අනුකූලව එකී කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

(4) නියමිත දිනයට මාස තුනකට පෙරාතුව එකී කාර්යයන් සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීම

18 මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතිය අනුසාරයෙන් සහ නියමිත ආකාරයට සභාවේ ලේකම් වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

සහතිකය ප්‍රදානය කිරීම

19 18 වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් ලැබුනු විට සභාව විසින් ඒ ස්වේච්ඡා සංවිධානය විසින් සපයනු ලැබූ සේවා සහ ආධාර සැලකිල්ලට ගෙන

ඒ සංවිධානය ලියාපදිංචි කොට ඒ බවට සහතිකයක් ඒ සංවිධානය වෙත නිකුත් කළ යුතුය.

වාර්ෂික සැළසුම් ඉදිරිපත් කිරීම

20 මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වන ඕනෑම සංවිධානයක් විසින් සහ රාජ්‍ය ආයතනයක් විසින් වාර්ෂික ක්‍රියාත්මක සැළසුම් ඉදිරිපත් කිරීමේදී 2 වන ඡේදය යටතේ පිහිටු වනු ලබන උපදේශක සභාව වෙත ඒ සඳහා බලය පැවරූ නිලධාරියෙකු විසින් කරනු ලබන ඉල්ලීම මත ඒවා ඉදිරිපත් කළයුතු වන්නේය.

21 මෙම ප්‍රඥප්තියේ 11. 1 වගන්තිය යටතේ පිහිටුවනු ලබන දකුණු පළාත් ආබාධිත ප්‍රජා මූලික පුනරුත්ථාපන කමටුව විසින් වාර්ෂික සැලසුම සමාලෝචනය කළයුතු අතර. අවසාන සැළසුම් උපදේශක සභාව විසින් දකුණු පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

සේවක පහසුකම් හා වැටුප් තීරණය කිරීම

22 (1) ආබාධිත තැනැත්තන් වෙනුවෙන් සේවාවන් සපයන ඕනෑම සංවිධානයක සේවකයින් බඳවා ගැනීමේදී සළකා බැලිය යුතු මූලික සුදුසුකම් තීරණය කිරීම මෙම ප්‍රඥප්තියේ 11 . 1 වගන්තිය අනුව පිහිටු වනු ලබන ආබාධිත තැනැත්තන් සඳහා වූ කමටුවේ දකුණු පළාත් මධ්‍යස්ථානයේ එකගත්වය අනුව උපදේශක සභාව විසින් කරනු ලැබිය හැකි වන්නේය.

(2) කම්කරු දෙපාර්තමේන්තුවේ අනුමත පඩිපාලක සභා තුළින් නියම කරන ලද සේවක කාණ්ඩයන් සඳහා නියමිත අවම වැටුප් ගෙවිය හැකි වන්නේය.

(3) පඩිපාලක සභාව විසින් නිශ්චය නොකරන ලද සේවක කාණ්ඩයන් වෙනුවෙන් අවම වැටුප නියම කිරීම ඒ හා සමානව පවතින වැටුප් ක්‍රම නොඉක්මවන පරිදි සකස් කළයුතු වන්නේය.

(4) මෙම ප්‍රඥප්තියේ 17-1 වන උප වගන්තිය යටතේ ලියාපදිංචි සංවිධාන හා සේවක සංවිධාන සාකච්ඡා කොට එකගත්වයකට පැමිණ අවම මාසික හෝ දෛනික වැටුප් තීරණය කර උපදේශක සභාවේ එකගත්වය ලබාගත යුතු වන්නේය.

IV කොටස
සාමාන්‍ය වධ විධාන

23 සභාවේ සියළුම නිලධරයන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා. රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

වරද හා දඬුවම

24 මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන තැනැත්තකු මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දස දහස නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේය.

අර්ථ නිරූපනය

25 "දකුණු පළාත" යන්නෙන් ගාල්ල. මාතර සහ හම්බන්තොට පරිපාලක දිස්ත්‍රික්ක ඇතුළත් පළාත අදහස් වේ.

" ආබාධ සහිත තැනැත්තා " යන්නෙන් [illegible]

ඉටුකර ගැනීමට නොහැකි යම් තැනැත්තකු අදහස් වේ.

"අමාත්‍යවරයා " යන්නෙන් දකුණු පළාතේ සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයා යන්න අදහස් වේ.

" ආණ්ඩුකාරවරයා " යන්නෙන් දකුණු පළාත් ආණ්ඩුකාරවරයා යන්න අදහස් වේ.

26 මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවු විට සිංහල භාෂා පාඨය වලංගු වන්නේය.

****

කුමාරි බාලසූරිය
ආණ්ඩුකාරවර
දකුණු පළාත.